# රටේ ව්‍යවස්ථාව ගැන නොදන්නා අයත් අපි පාර්ලිමේන්තුයවල තියෙනවා



ෆැපරල් විධායක අධ්‍යක්ෂක
**රෝහණ හෙට්ටිආරච්චි**

■ ජූඩ් සමන්ත-පුත්තලම

**පාර්ලිමේන්තුවට තෝරා පත් කර යවන නියෝජිතයන්ගෙන් ජනතාව අපේක්ෂා කළ යුත්තේ තමන් හෝ තම ගම ගැන පමණක් නොව රටේම යහපත බව තේරුම් ගන්නා තුරු පාර්ලිමේන්තුව දූෂිතයි කියා චෝදනා කිරීම නැවැත්වීමට හැකියාවක් නැතැයි නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය (ෆැපරල්) හි විධායක අධ්‍යක්ෂක රෝහණ හෙට්ටිආරච්චි පැවසීය.**

මාදම්පේ සෙඩෙක් ආයතනයේ පැවති දේශපාලන සංවාදයකදී හෙතෙම මේ බව කියා සිටියේය. 'පැහැදිලි දැක්මක් - නිවැරදි තීරණයක්' මැයෙන් මෙම දේශපාලන සංවාදය පැවැත්වුණි.

එහිදී තවදුරටත් කතා කළ රෝහණ හෙට්ටිආරච්චි, මෙසේ පැවසීය.

''පාර්ලිමේන්තුව කියන්නේ පළාත් පාලන ආයතන හෝ පළාත් සභාව නෙවෙයි. පාර්ලිමේන්තුවට සුවිශේෂී කාර්ය භාරයක් තිබෙනවා. අනෙකුත් මහජන නියෝජිත ආයතනවලටත් වෙන්වූ සුවිශේෂී කාර්ය භාරයන් තිබෙනවා. ගැටලුව වන්නේ එම ආයතනවලට තේරී පත්වන මහජන නියෝජිතයින් තමන්ගේ කාර්ය භාරය දන්නවාද කියන එකයි. ඒ වගේම ජනතාව හැටියට අපි ඔවුන්ට පැවරෙන කාර්ය භාරය දැන ගෙනද පත් කරන්නේ කියන කාරණයයි. මහජනතාව දැනගෙන පත් කරනවා නම්, නියෝජිතයන් දැන ගෙන යනවා නම් ඒ ආයතන දූෂිතයි කියන්න අපිට වෙන්නේ නෑ. පාර්ලිමේන්තුව දූෂිත නැහැ. පාර්ලිමේන්තුව කියන්නේ ගෞරවනීය තැනක්.

පාර්ලිමේන්තුව කියන්නේ මේ රටේ ප්‍රතිපත්ති නීති සම්පාදනය කරන තැන. නමුත් පසුගිය කාලේ අපි දැක්කා රටේ ව්‍යවස්ථාව කියන්නේ මොකක්ද කියන එක නොදන්න මන්ත්‍රීවරුන් අපි පාර්ලිමේන්තුව යවලා තියනවා කියන කාරණය. ඒක අපේ වරද. අපේ රටේ මැතිවරණ ක්‍රමය අනුව දේශපාලන පක්ෂ විසින් දෙන ලැයිස්තුවලට තමයි අපිට ඡන්දය පාවිච්චි කරන්න වෙන්නේ. දේශපාලන පක්ෂ නායකයින් අසමත් වුණොත් හොඳ අයව ලැයිස්තුවට දන්න අපිට ජනතාවට චෝදනා කරන්න හැකියාවක් නැහැ. ඒ නිසා තමයි මාර්තු 12 ව්‍යාපාරය නිර්ණායක සමූහයක් හැදුවේ. ඒ නිර්ණායකවලට අනුව නාම යෝජනා දෙන්න කියලා. නායකයෝ ඒවට අත්සන් කළාට කෙතරම් දුරට අනුගත වෙනවද කියලා ප්‍රශ්නයක් තියනවා. අපි හිතන්නේ මන්ත්‍රීවරයාගේ කාර්ය භාරය වෙන්නේ මගේ දරුවාට හොඳ පාසලක් ලබා දීම, එහෙම නැත්නම් ගමට හොඳ පාසලක් හදලා දෙන එක කියලයි. නමුත් අපි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගෙන් බලාපොරොත්තු විය යුත්තේ මේ රටේ ඉන්න හැම දරුවෙකුටම හොඳ පාසලක් ලබාදීම සඳහා වන ප්‍රතිපත්තිය සකස් කරන එකයි. ඒ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නීතිය සම්පාදනය කරන එක. ඒ නීතිය සහ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන මූල්‍ය කළමණාකරනය කරන එක. නමුත් අපි මන්ත්‍රීවරුන්ගෙන් අපේක්ෂා කරන්නේ ඒක නෙවෙයි. මේක තමයි තියන ගැටලුව.

මන්ත්‍රීවරුන් කියන්නේ දිව්‍ය ලෝකයෙන් ආපු පිරිසක් නෙමෙයි. අපි තමුන්නාන්සේලා අතර ඉන්න පිරිසක්. සමාජයම දූෂණය වෙලා තියනවා නම්, සමාජයෙන් මේවා ප්‍රශ්න කරන්නේ නැත්නම් මන්ත්‍රීවරුන්ගේ හැසිරීමත් ඒ අකාරයෙන්ම බව අපි අමතක කරන්න හොඳ නැහැ.''